# 2026 වර්ෂය සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම - මස්කෙළිය ප්‍රාදේශීය සභාව

2026 වර්ෂය සඳහා මස්කෙළිය ප්‍රාදේශිය සභාවට අවශ්‍ය පහත සඳහන් භාණ්ඩ හා සේවා ලබා ගැනීමට සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම සඳහා පිළිගත් සැපයුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1. කාර්යාලීය ගෘහ භාණ්ඩ හා ලී බඩු උපකරණ
2. i. කාර්යාලීය උපකරණ ( ෆැක්ස් යන්ත්‍ර, මුද්‍රණ යන්ත්‍ර, ඡායා පිටපත් යන්ත්‍ර, මල්ටිමීඩියා යන්ත්‍ර, සීසීටීවී කැමරා, ඇඟිලි සලකුණු යන්ත්‍ර, සේප්පු හා වානේ මුදල් පෙට්ටි යනාදී )
   ii. ලිපිද්‍රව්‍ය
3. රිබන් හා ටෝනර්, කාට්රිජ්
4. මුද්‍රණ සේවා
5. පරිගණක හා උපාංග
6. කාර්යාලීය යන්ත්‍රසූත්‍ර හා උපකරණ අළුත්වැඩියාව හා සේවා කිරීම (පරිගණක,ඡායාපිටපත් යන්ත්‍ර,ෆැක්ස් මැෂින්, මුද්‍රණ යන්ත්‍ර, සීසීටීවී කැමරා, ඇඟිලි සලකුණු යන්ත්‍ර සහ ජෙනරේටර්)
7. කාර්යාලීය හැඳුනුම්පත්, නාමපුවරු සහ බැනර්, නිල මුද්‍රා, රබර් මුද්‍රා, පදක්කම් කුසලාන සිහිවටන සැකසීම හා සැපයීම
8. i. සෞඛ්‍යාරක්ෂිත උපකරණ හා ඇඳුම්
   ii. පිරිසිදු කිරීමේ උපාංග, පිරිසිදු කාරක සහ මැසිනාශක ඇතුළු රසායනික ද්‍රව්‍ය
9. සංග්‍රහ කටයුතු සඳහා අවශ්‍ය ආහාරපාන හා ද්‍රව්‍ය
10. i. වාහන අමතර කොටස් සැපයීම
    ii. ටයර්, ටියුබ් හා බැටරි ( වාහන සඳහා )
11. වාහන සේවා කිරීම, අළුත්වැඩියාව හා නඩත්තුව
12. වාහන කුලියට ලබාගැනීම ( ත්‍රීරෝද රථ, කාර් රථ, වෑන් රථ, කැබ් රථ, කුඩා ලොරි රථ )
13. සියළුම විදුලි පහන්, වීදි ලාම්පු හා අවශ්‍ය උපාංග
14. විදුලි උපකරණ හා විදුලි පරිපථ උපාංග
15. ජල නළ හා උපකරණ
16. ගල්, වැලි, මැටල් හා බ්ලොක්ගල් ආදී ගොඩනැගිලි ඉදිකිරීම් ද්‍රව්‍ය සහ තීන්ත සැපයීම
17. මාර්ග අළුත්වැඩියාව සඳහා වන අමුද්‍රව්‍ය (තාර,කෝලාස්,ප්‍රිමික්ස් ආදිය)
18. ක්‍රීඩා උපකරණ, ක්‍රීඩා භාණ්ඩ හා ව්‍යායාම උපකරණ
19. ළමා උද්‍යාන සඳහා ක්‍රීඩා උපකරණ හා ක්‍රීඩා භාණ්ඩ සැපයීම
20. ගර්භණී මාතාවන්ට අවශ්‍ය උපකරණ, ළදරු නිෂ්පාදන
21. නිම් ඇඳුම්, නිල ඇඳුම් රෙදි, මේස රෙදි හා තිර රෙදි සැපයීම හා මැසීම
22. උද්‍යාන අලංකරණය හා අභ්‍යන්තර අලංකරණය
23. ගිනි නිවීම් උපකරණ
24. බෙලර් යන්ත්‍ර, තණකොළ කපන යන්ත්‍ර සහ ස්ප්‍රේ යන්ත්‍ර අළුත්වැඩියාව හා සේවා කිරීම
25. පුස්තකාල සඳහා පොත් සහ පුවත්පත් සැපයීම
26. පුවත්පත් දැන්වීම් පළකිරීම සඳහා නියෝජිතවරුන්
27. ආයුර්වේද ඖෂධ, වෛද්‍ය උපකරණ සැපයීම
28. කාන්තාවන් සඳහා ස්වයං රැකියා සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය සැපයීම
29. පරණ පත්තර, අබලි ද්‍රව්‍ය හා පෙට් බෝතල් මිලදී ගැනීම්
30. ගස් කැපීම, ඇද බැද තැබීම සහ ගස් අතු කැපීමේ සේවා සැපයීම
31. නීතිඥ සේවා සැපයීම
32. ගොඩනැගිලි සැලසුම් නිර්මාණ ශිල්පීන්
33. බීජ වර්ග, පැල වර්ග හා පොහොර වර්ග
34. කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචිය - ව්‍යාපෘති වටිනාකම රුපියල් ලක්ෂ 10 ට අඩු
35. කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචිය - ව්‍යාපෘති වටිනාකම රුපියල් ලක්ෂ 10 ට වැඩි

**<u>කොන්දේසි</u>**

- ලියාපදිංචි වීම සඳහා අයදුම්පත්‍රය www.maskeliya.ps.gov.lk වෙබ් අඩවිය මගින් භාගත කර ගත හැකි අතර සභා කාර්යාලයෙන් ද ලබා ගත හැක.
- ඉහත සඳහන් එක් එක් අයිතමයක් සඳහා වෙන වෙනම අයදුම්පත් ඉදිරිපත් කල යුතු අතර, ඒ සඳහා වෙන් වෙන් වශයෙන් ගාස්තු ගෙවීම් කල යුතුය.

- එක් සැපයුම් ද්‍රව්‍යයක් සඳහා රුපියල් 1500.00 ක මුදලක් ගෙවා ලියාපදිංචි විය යුතුය.
- කොන්ත්‍රාත්කරුවන් සඳහා රුපියල් 3000.00 ක මුදලක් ගෙවා ලියාපදිංචි විය යුතුය.
- ගෙවීම් සිදු කිරීම ප්‍රධාන කාර්යාලයට පැමිණ හෝ චෙක්පත් මගින් කල හැකි අතර චෙක්පත් **"ලේකම්, මස්කෙළිය ප්‍රාදේශීය සභාව"** නමින් ලිවිය යුතුය.
- අයදුම්පත් භාර ගැනීම 2025.12.19 දින ප.ව.3.00 ට අවසන් වේ
- අයදුම්පත් **"සභාපති, මස්කෙළිය ප්‍රාදේශීය සභාව, මස්කෙළිය"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ කාර්යාලය වෙත ගෙනවිත් භාරදිය හැකිය. අයදුම්පත් බහා එවන ලිපි කවරයේ වම්පස ඉහල කෙළවරේ **"සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම - 2026"** වර්ෂය යනුවෙන් සඳහන් කළ යුතුය.

කේ. රාජ්කුමාර්,
සභාපති,
මස්කෙළිය ප්‍රාදේශීය සභාව,
මස්කෙළිය.
විමසීම - 052-2277275